චක්‍රලේඛ අංක :- 02/2009

මගේ අංකය : බප/සසේකො/ලේ.නිර්/2009
සමූපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.),
අංක 50, කිතුල්වත්ත පාර,
කොළඹ 08.
2009.02.18

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමූපකාර සමිති,
ග්‍රාමීය බැංකු සංගම් හා ස.ණ.ස. සමිතිවල
සභාපතිවරුන් වෙත.

<u>සමූපකාර සේවකයින් සඳහා 2009 වර්ෂයේ නිවාඩු.</u>

සමූපකාර සේවක කොමිෂන් සභා රෙගුලාසි මාලාව අනුව සමූපකාර සේවකයින්ට හිමිකම් ඇති ප්‍රසිද්ධ නිවාඩු වූ තලි කාර්යාල සේවක පනත යටතේ ගරු කම්කරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පමුණුවන ලද දිනයන්ම වේ. මේ අනුව පහත සඳහන් දිනයන් සමූපකාර සේවකයින් සඳහා නිවාඩු දින වශයෙන් කොමිෂන් සභා නියමය පරිදි දන්වමි.

| | | |
|---|---|---|
| (1) | ජනවාරි 14 | දෙමළ තෛපොන්ගල් දිනය |
| (2) | පෙබරවාරි 04 | ජාතික දිනය |
| (3) | මාර්තු 10 | නබි නායකතුමාගේ ජන්ම දිනය |
| (4) | අප්‍රේල් 13 | සිංහල/දෙමළ අළුත් අවුරුදු දිනට පෙර දිනය |
| (5) | අප්‍රේල් 14 | සිංහල/දෙමළ අළුත් අවුරුදු දිනය |
| (6) | මැයි 01 | මැයි දිනය |
| (7) | මැයි 09 | වෙසක් පුර පසළොස්වක දිනයට පසු දිනය |
| (8) | දෙසැම්බර් 25 | නත්තල් දිනය |

02. ඉහත සඳහන් දිනයන්ට අමතරව සමූපකාර සංවර්ධන කොමසාරිස් විසින් සමූපකාරිකයින්ගේ දිනය වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන දිනයද නිවාඩු වශයෙන් දිය යුතුය. තවද මීට අමතරව රජය විසින් අවස්ථාවෝචිත පරිදි ''රජයේ නිවාඩු'' දිනයන් ලෙස ප්‍රකාශයට පත්කරනු ලබන දිනයන් සඳහා හාම්පුතුන්ගෙන්ද සිය සේවකයින් සඳහා නිවාඩු දෙන ලෙස ඉල්ලීමක් කළහොත් එවැනි අවස්ථාවල සමූපකාර සමිතිවලටද අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය පරිදි තම සේවකයින්ට නිවාඩු දීම ගැන තීරණය කළ හැකිය. 2009 වර්ෂය සඳහා සිංහල/දෙමළ අවුරුද්දට පෙර දිනයත් නිවාඩු වශයෙන් යොදා ඇති බැවින් පාරිභෝගිකයින්ගේ පහසුව තකා යම් සමිතියක් කැමැත්තේ නම් සමිති කාර්යාලය හෝ ප්‍රාදේශිකයන් මේ දිනවල එක් දිනයක් හෝ දින දෙකම හෝ විවෘතව තැබීමටත්, එම දිනවල වැඩ කිරීම සඳහා සේවකයින්ට උපදෙස් දීමටත් කොමිෂන් සභාවේ අනුමැතිය ලැබේ. එසේ ක්‍රියාකරනු ලැබූ අවස්ථාවලදී ඒ වෙනුවෙන් සමාන දින ගණනක් සම්පූර්ණයෙන්ම වැටුප් සහිතව ඊළඟට එන දින 30 ඇතුලතදී සේවකයින්ට නිවාඩු ලබාදිය යුතුය. මෙසේ සමිති කාර්යාලයක්, සමිති ප්‍රාදේශිකයක් විවෘතව තබන අවස්ථාවලදී සේවයේ යෙදවීමට උපදෙස් දෙනු ලැබූවේ මුළු සේවක සංඛ්‍යාවම වුවත්, ඉන් කොටසක් වුවත් නොපමාව ඒ බැව් කොමිෂන් සභාව වෙත වාර්තා කළ යුතුය.

03. ඉහත දැක්වූ නිවාඩු දින වලින් කිසිවක් සමිතියේ සතිපතා දෙන නිවාඩු 11/2 ට ඇතුලත් වුවහොත් ඒ වෙනුවට පිළිවෙලින් අඩ දිනක් හෝ සම්පූර්ණ දිනක් නිවාඩු වශයෙන් ඊළඟට එන දින

30 ඇතුලතදී සේවකයින්ට නිවාඩු වශයෙන් දිය යුතුය. මීට විකල්පයක් වශයෙන් දෙපක්ෂයේ එකඟතාවය ඇතුව ඒ වෙනුවට දින භාගයක හෝ එක් දිනක වැටුප හෝ අවස්ථාවෝචිත පරිදි ගෙවිය යුතුය.

කොමිෂන් සභාවේ නියමය පරිදිය.

ජේ.කේ. සිරිසේන,
ලේකම්,
සමූපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

<u>පිටපත්</u>

(1) බ.ප. පළාත්මාර්ග හා සමූපකාර අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම්
(2) ප්‍රධාන ලේකම් (බ.ප.)
(3) ලේකම්, පළාත්මාර්ග හා සමූපකාර අමාත්‍යාංශය (බ.ප.)
(4) සමූපකාර සංවර්ධන කොමසාරිස් හා සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් (බ.ප.)
(5) සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ, කළුතර, ගම්පහ)
(6) ලේකම්, සමූපකාර සේවක කොමිෂන් සභාව
(7) සියළුම පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්
(8) සියළුම වෘත්තීය සමිති සංගම්